


මින්සඳි නෙලිත්මා විජේසිංහ

# යාළුවෝ පස් දෙනයි වඳුරු රැළයි.

මින්සඳි නෙලිත්මා විජේසිංහ

# යාළුවෝ පස් දෙනයි වඳුරු රැළයි


| | | |
|---|---|---|
| කතෘගේ නම | : | මින්සඳි නෙලිත්මා විජේසිංහ |
| කතෘ අයිතිය | : | මින්සඳි නෙලිත්මා විජේසිංහ |
| කථාව හා චිත්‍ර | : | මින්සඳි නෙලිත්මා විජේසිංහ |
| කතෘගේ වෙනත් කෘති | : | පුංචි ගඟුලි |
| | | පළමු මුද්‍රණය - 2021<br>දෙවන මුද්‍රණය - 2023 |
| කෘතිය පළ කරන දිනය | : | 2023.11.15 |
| ISBN අංකය | : | 978 - 624 - 206 - 813 - 8 |
| ප්‍රකාශක | : | මහාමයා බාලිකා විද්‍යාලය, මහනුවර |



සියලු හිමිකම් කතෘ සතුය. කතෘ අවසරයකින් තොරව මුද්‍රණය හා බෙදා හැරීම සපුරා තහනම්.

# පිදුම

**මාගේ අම්මාට හා අප්පච්චිට**

**ආදරයෙන්**

**මෙම පොත පිළිගන්වමි.**

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත්  බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි  එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින්  ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු  පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින්  " දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලද් දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම  නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා  සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 . 11 . 01



ඔන්න එකමත් එක කාලෙක ඈත කැළේ යාළුවෝ පස් දෙනෙක්  හිටියා. එයාලා තමයි චූටි අලි පුංචයි, හා අක්කයි, ඉත්තෑ පුංචයි, බලු පැංචයි, ජිරාෆ් පැංචයි. ඒ යාළුවෝ පස් දෙනාව හඳුනගන්න එක නම් හරිම ලේසියි.



දන්නවානේ, මේ යාළුවන්ගෙන් චූටිම එක්කෙනා තමයි අලි පැංචා. ඒක හින්දා එයාට හැමෝම ආදරෙයි. ඔයාලට හිතාගන්න පුලුවන්නේ චූටි අලි පැංචා කොහොමද කියලා. හරිම දඟයි. එයා මේ යාළුවෝ පස් දෙනා එක්ක හිටියෙ නැත්තම් මේ කතාව ඔයාලට කියන්න වෙන්නෙ නෑනෙ. මේ අලි පැංචාගේ නම චුට්ටා.



මේ යාළුවෝ පස් දෙනාගෙ ආරක්ෂාව ගැන හිතන කෙනෙකුත් ඉන්නවා, එක්කෙනෙක් විතරක් නෙමේ, දෙන්නෙක්ම. දැන් මං ඔයාලට එහෙම නම් ඒ දෙන්නත් හඳුන්වලා දෙන්නම්. ඒ තමයි අපේ ඉත්තෑ පුංචා. එයානෙ මේ යාළුවන්ගෙන් වැඩිමල්, ඒ කියන්නෙ වයසින් වැඩිම. හැබැයි ඉතින් එයාටත් තාම අවුරුදු හතයි. දැන් ඔයාලා කල්පනා කරනවා ඇති කොහොමද මෙයා යාළුවන්ව ආරක්ෂා කරන්නේ කියලා. ඉත්තෑ කූරු හරි විසයි කියල ඔයාලා දන්නවානේ. ඉතින් අපේ ඉත්තෑ පුංචා මේ යාළුවන්ව බලා ගන්නෙත් එහෙම. එක හින්දා හැමෝම මේ යාළුවන්ට බයයි.


මං කිව්වේ, තවත් අපේ චූටි යාළුවෙක් ඉන්නවා කියලා මේ යාළුවන්ව ආරක්ෂා කරන, එයා තමයි අපේ බලු පැංචා. එයාගෙ නම තමයි බිංකො. ඒත් එයාට හැමෝම කියන්නෙ බිංකා කියලා.



මේ යාළුවන්ගෙන් දැන් හඳුන්වලා දෙන්න තියෙන්නේ පිරාග් පුංචා විතරයි.  ආ... නෑනෙ තව හා පුංචාත් ඉන්නවානේ. මං ඔයාලාට මුලින්ම හා පුංචාව හඳුන්වලා  දෙන්නම්. එයා  තමයි මේ යාළුවන්ට කෑම ගෙනත් දෙන්නේ. හා පැංචගේ නම පිංකි.



දැන් අපි පීරාග් පුංචාව හඳුනගෙන ඉමු. දන්නවානේ, එයා තමයි මේ යාළුවන්ගෙන් උසම. මෙයත් හරිම චූටියිනේ. අපේ චුට්ටාත් එක්ක ගත්තොත් අපේ පීරාග් පුංචාගෙ උපන් දිනය වෙනස් එක දවසකින් විතරයි. ඒක හින්දා මේ දෙන්නා හරිම හොඳ යාළුවෝ. පීරාග් පුංචාගේ නම පීෆියා.



දැන් මං ඔයාලට මේ යාළුවන්ව හඳුන්වලා දුන්නනෙ. ආ... තව පොඩ්ඩෙන් අමතක වෙනවා කියන්න. මේ යාළුවෝ ඉන්නෙ කැළෑවෙනෙ. ඒ කැළෑව ගොඩක් ලොකු කැළෑවක්. මේ කැළෑවෙ මේ යාළුවෝ විතරක් නෙමේ තව ගොඩක් සත්තු හිටියා. ඉතින් මේ කැළෑවෙ තව වඳුරු රැළක් හිටියා, ඒ රැළේ නායක වඳුරා හරිම මෝඩයි. එයාගෙ මෝඩ වැඩ හින්දා හැමවෙලේම මේ වඳුරු රැළ කරදරේ වැටෙනවා. මුළු කැළේම ඉන්න සත්තුයි, චූටි පැටවුනුයි, කුරුල්ලොයි ඔක්කොම සත්තු අපේ චූටි යාළුවෝ පස් දෙනත් එක්කම මේ වඳුරු රැළ ගැන දන්නවා. මේ වඳුරු රැළ ගැන දන්නෙ නැති කෙනෙක් නෑ කිව්වොත් හරියටම හරි.



එක දවසක් අපේ චූටි යාළුවෝ පස් දෙනා කෑම ගනිද්දි අර වඳුරු රැළ ආවා. එතකොට වඳුරු රැළේ නායකයාට ඒවා ඕන වුණා. ඒත් ළඟට යන්න බයේ බෑ ඉත්තෑ පුංචා එතන නෙ. ඉතින් මේ වඳුරු නායකයා මෙන්න මෙහෙම ඇහුවා "අපිටත් ඔයාලගෙ කෑම ටිකක් දෙනවද?" කියලා. ඒත් අපේ පිංකිට ඕන වුණේ නෑ එයා මහන්සි වෙලා එකතු කරපුවා වඳුරු හාමිට දෙන්න.

ඒත් එකපාරටම එයාට පොකුණ ගාව තියෙන තණ බිම මතක් වුණා.  ඒක කවුරුත් හැඳින්වූයේ "රජ බිම" කියලයි.

"අර රජ බිමේ ඇති වෙන්න තියෙන්නෙ කෑම. ඔයාලට ඕනෙ තරම් කන්න පුලුවන්". පිංකි එහෙම කිව්වම මුළු වඳුරු රැළටම ඉවසිල්ලක් නැතුව ගියා. ඉතින් ඒ වඳුරු රැළ ගසින් ගසට පනිමින් රජ බිමට ගියා.



දැක්කනෙ කෑදර වුණාම වෙන දේ. එදා වඳුරු රැළට වුණ දේ අහලා කැළේ සත්තු ඔක්කෝටම හොඳටම හිනා ගියා.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

9 786242 068138

පොතේ මිල රු. 200